# දුරකථනය කුටුම්භ සන්නිවේදනය දුරස්ථභාවයට බලපාන අයුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්.

*ඩබ්ලිව්.ඒ.ටී.ඩී. වික්‍රමරත්න[1]*

තාක්ෂණයේ දියුණුවෙහි ප්‍රතිඵලයක් ලෙස සෑම නිවසක ම ලොකු කුඩා සියලු සාමාජිකයන් අතර ම දුරකථනය අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. මෙබැවින් පවුලේ සාමාජිකයන් අතර පවතින අන්‍යෝන්‍ය සන්නිවේදනය දුරස්ථ ව මොවුන් දුරකතනය සමඟ හුදෙකලා ව කාලය ගත කරයි. මේ නිසා කුටුම්භ තුළ පවතින අන්‍යෝන්‍ය බැඳීම දුරස්ථ වී ඇති බව හඳුනාගත හැකි ය. යථෝක්ත පරීක්ෂණයේ පර්යේෂණ ගැටලුව ලෙස දුරකථනය කුටුම්භ සන්නිවේදනයේ දුරස්ථභාවයට බලපාන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වසයෙන් දුරකථනය නිසා කුටුම්භය ඇති වී තිබෙන දුරස්ථභාවය අවම කරගන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම වන අතර ඵ අරමුණු වසයෙන් දුරකථන නිසා කුටුම්භය ඇති වී තිබෙන දුරස්ථභාවය අවම කරගන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම වන අතර උපඅරමුණු වසයෙන් දුරකථන නිසා කුටුම්භය තුළ පවතින දුරස්ථභාවය අවම කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ පුද්ගලයන් අතර දැනුවත් භාවයක් ඇති කිරීම අරමුණු වශයෙන් තබාගෙන මෙම අධ්‍යනය සිදු කරන ලදී. මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේදයන් භාවිතා කරන ලදී. ක්ෂේත්‍ර නොවන ගවේෂණයන් යටතේ පූර්ව අධ්‍යයන පිළිබඳ අවධානය යොමු කර ඇත. එහි පර්යේෂණ ආශ්‍රයෙන් ප්‍රකාශයට පත් වූ ග්‍රන්ථ සහ ලිපි ආදිය අධ්‍යයනය කෙරුණි. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ නිවාසවලින් තොරතුරු ලබා ගනු ලැබී ය. ප්‍රතිඵල සහ සාකච්ඡාව ලෙස මෙම අධ්‍යයනය මඟින් කුටුම්භය තුළ දුරකථනය නිසා සන්නිවේදනය දුරස්ථභාවය ඇති වීමට බලපාන ලබන හේතු සාධක රැසක් අනාවරණය කර ගැනීමට හැකි විය. මෙහි දී කුටුම්භය තුළ සිටින සාමාජිකයන් දෛනික ව තම ජීවිතය දුරකථනය සමඟ කාලය ගත කිරීමට වැඩි හොරා ප්‍රමාණයක් වැය කිරීම තුළින් නිවැසියන්ට අන්‍යෝන්‍ය වසයෙන් අදහස් හුවමාරු කරගැනීමට හැකියාවක් උදාවීම සීමිත වේ. මෙමඟින් කුටුම්භයේ පුද්ගලයන්ට විවිධ මානසික ව්‍යාධීන්වලට ගොදුරු වීමට ඉඩකඩ ඇති අතර එය සියදිවි නසා ගැනීමට තරම් උග්‍ර වී ඇත. පවුලේ දරුවන් තම විවේකී කාලය පෙර තම සහෝදරයන් සමඟ විනෝදයෙන් විවිධ ක්‍රීඩාවල නිරත වෙමින් ගත කළ නමුත් වර්තමානයේ දුරකථන ක්‍රීඩාවල දරුවන් තනි ව ම නිරතවීම මඟින් පවුල තුළ සහෝදර සහෝදරියන් අතර මනා සන්නිවේදනයක් සිදු නො වේ. එමෙන් ම කුටුම්භයෙහි සිටින දරුවන් උපදෙස් ලබා ගැනීම තම ප්‍රශ්න ගැටලු දුක සැප බෙදා ගැනීම නිවැසියන් අතර සිදු කිරීම සීමා සහිත කර ඇති අතර දුරකථනයෙන් හඳුනාගත් පුද්ගලයන් අතර ඒ පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම තුළින් කුටුම්භ සන්නිවේදන දුරස් ව ගොස් ඇත. තව ද වර්තමානයේ පුද්ගලයන් දුරකථන ක්‍රමයට තම ව්‍යාපාර ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සිදු කිරීම තුළින් කුටුම්භය තුළ සන්නිවේදනය දුරස් වී ඇති බව මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. නිගමනය ලෙස වර්තමාන සමාජ සන්දර්භය තුළ තාක්ෂනික දියුණුවත් සමඟ පුද්ගලයන්ට දුරකථන දෛනික කටයුතු සඵල කර ගැනීමට බොහෝ ඵලදායි ය. එහෙත් කුටුම්භය තුළ දුරකථන භාවිතයට ඇබ්බැහි වීම ස්වයං පාලනයක් සහිත ව කුටුම්භ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වාගෙන භාවිත කළ යුතු බව මෙම පර්යේෂණ අධ්‍යයන මඟින් නිගමනය කරනු ලැබී ය.

***ප්‍රමුඛ පදඃ*** දුරකථනය, කුටුම්බය, සන්නිවේදනය, පවුල, සාමාජිකයන්

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, wickramarathanathanuja@gmail.com